සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 7 - ශ්‍රේණිය

## ඉතිහාසය

**නම/විභාග අංකය :- ....................................................... කාලය: පැය 02යි.**

**I කොටස**

◆ප්‍රශ්න සියල්ලට ම දී ඇති උපදෙස් අනුව පිළිතුරු සපයන්න.

◆ අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

(01) අතීතයේ අප රටෙහි වසරකට කන්න තුනක් වී වගාව කළ බවට සඳහන් වන සෙල්ලිපිය කුමක්ද?

(1) හැටදාගෙයි සෙල් ලිපිය (2) කෝනිගල සෙල්ලි ලිපිය

(3) දඹුලු පර්වත ලිපිය (4) ගල්පොත සෙල් ලිපිය

(02) මින්නේරි දෙවියන් නමින් ප්‍රචලිත වූ මින්නේරිය වැව කරවූ රජතුමා කවුරුන්ද?

(1) මහසෙන් රජු (2) වසභ රජු

(3) ධාතුසේන රජු (4) පණ්ඩුකාභය රජු

(03) අනුරාධපු යුගයේදී රුවන්වැලිසෑය අලංකාර කිරීමට රෝමයෙන් පබලු ගෙන්වාගනු ලැබුවේ

(1) දුටු ගැමුණු රජතුමා ය (2) දේවානම් පියතිස්ස රජතුමා ය

(3) භාතිකාභය රජතුමා ය (4) සද්ධාතිස්ස රජතුමා ය

(04) සකපෝරුව නැමැති උපාංගය භාවිත කළ කර්මාන්තය වන්නේ

(1) කපු (2) උක්

(3) මැණික් (4) මැටි

(05) අනුරාධපුර යුගයේ සෑම ගම් දහසකටම වෛද්‍යවරයකු බැගින් පත් කළ රජතුමා වූයේ

(1) සද්ධාතිස්ස රජු (2) බුද්ධදාස රජු

(3) පළමුවන උදය රජු (4) පළමුවන සේන රජු

◆ **අංක 06 සිට 10 තෙක් දී ඇති ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✓) ලකුණ ද යොදන්න.**

(06) චෝල රාජ්‍යයේ අගනුවර තන්ජෝරයයි ( )

(07) සිය දියණියන් සූප ශාස්ත්‍රයේ දක්ෂයන් බවට පත් කිරීම දෙමව්පියන්ගේ වගකීමක් බව සහස්සවත්ථුපකරණයේ සඳහන් වේ. ( )

(08) යුනෙස්කෝ සංවිධානය විසින් පිළිගෙන ඇති ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුම සංඛ්‍යාව පහකි ( )

(09) අනුරාධපුරයේ රජ කළ මහචූලි මහා තිස්ස රජු ශ්‍රමිකයෙකු ලෙස වෙස් වලාගෙන කුඹුරක අස්වනු නෙලීමට සහය විය. ( )

(10) ග්‍රීකවරුන් ශ්‍රී ලංකාව හැඳින්වූයේ තැප්‍රොබේන් නමිනි ( )

◆ **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල හිස්තැන් සඳහා නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

(11) අතීතයේ දී ඇතුන් පිළිබඳ කාර්යාංශයේ ප්‍රධානියා ........................................ ලෙස හඳුන්වා ඇත.
(අශ අදෙක/අති අදෙක/සේනාපති)

(12) මහා වංශයට අනුව ........................................................ රජතුමා දිවා රාත්‍රී තම මවට ඇප උපස්ථාන කර ඇත.
(සංඝබෝධි / අටවන අග්ගබෝධි / පළමු සේන)

(13) පැරණි මොහෙන්දජාරෝ නගරය වර්තමානයේ ........................................................ අයත් වේ.
(ඉන්දියාවට/පකිස්ථානයට/චීනයට)

(14) තුන්වන විජයබාහු රජතුමා ................................................. අගනුවර රාජත්වයට පත් විය. (යාපහුව/දඹදෙණිය/ගම්පොළ)

(15) අතීතයේ සෙල්ලිපිවල ''පිටබිම්'' ලෙස හඳුන්වා ඇත්තේ.................................................. ය.(පැල/හේන්/කමත්)

◆ **අංක 16 සිට 20 තෙක් ප්‍රශ්න සඳහා සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

(16) අනුරාධපුර මුල් යුගයේ ගම් පාලනය කළ පිරිස ............................................... යනුවෙන් හඳුන්වා ඇත.

(17) ශ්‍රමයට ශ්‍රමය හුවමාරු කර ගැනීමේ ක්‍රමය අතීතයේදී හැඳින්වූයේ ................................. ක්‍රමය ලෙසයි.

(18) පේෂකර්මාන්තයේ යෙදුණු ශිල්පීන් ..................................................... ලෙස හඳුන්වා ඇත.

(19) දසගම් පාලනයට හා අපරාධ නඩු විසඳීමට අදාළ නීති රැසක් ................................................ ශිලා ලිපියේ සඳහන් වේ.

(20) පැපිලියානේ සුනේත්‍රාදේවි පිරිවෙන, කැරගල පද්මාවති පිරිවෙන ආදි පිරිවෙන් ආරම්භ වූයේ .................................................... යුගයේදී ය

(ලකුණු 2 × 20 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- ඔබ විසින් පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.




(01) (අ)(i) යාබද සිතියමේ දී ඇති අක්ෂරවලට අදාළ නම් පහත සඳහන් ලැයිස්තුවෙන් තෝරා සිතියමේ අදාළව අක්ෂරය ඉදිරියෙන් ලියන්න.

1. ගම්පොළ
2. පොළොන්නරුව
3. අනුරාධපුරය
4. මාතොට
5. වලවේ ගඟ
6. මහා නාගහුල

(ලකුණු 6)

A රූපය



(ආ) (i) A රූපයෙන් දැක්වෙන පුද්ගලයාගේ නම කුමක්ද?

(ii) මොහු කුමන ශිෂ්ටාචාරයකට අයත් වේද?

(iii) මෙතුමාගේ කාලයේදී ඉදි වූ පැරණි ස්මාරකයක් නම් කරන්න

(ලකුණු 3)

(ඇ) (i) B රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?

(ii) මෙය ඉදිකර ඇත්තේ කවර රජකෙනෙකු උපන් ස්ථානයේද?

(iii) මෙතුමාගේ පියාගේ නම කුමක්ද?

(ලකුණු 3)

B රූපය



(02) (i) පුරාණ ජීවන රටාවේ ප්‍රධාන ක්ෂේත්‍ර තුන නම් කරන්න.(ලකුණු 03)

(ii) (a) අතීතයේ හේන්වල වගා කරන ලද කටුසැර බෝග වර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(b) පහත සඳහන් වචනවල තේරුම් ලියා දක්වන්න.

(1) නවදූලිහේන

(2) ගිනියාතිකාව (ලකුණු 04)

(iii) (a) අතීතයේදී ශ්‍රීලංකාව වෙළඳ සම්බන්ධතා පැවැත් වූ රටවල් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(b) විදේශ රටවලින් මෙරටට ගෙන එන ලද භාණ්ඩ වර්ග තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(03) (i) අනුරාධපුර මුල් යුගයේ මෙරට පාලනය කළ කීර්තිමත් රජවරු තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 03)

(ii) අනුරාධපුර යුගයේ මෙරට රාජ්‍ය පාලනය කළ රජ පෙළපත් දෙක නම් කරන්න. (ලකුණු 04)

(iii) (a) රටේ දේශපාලන ස්ථාවරත්වය ඇති කිරීම සඳහා මානවම්ම රජු ගත් පියවර දෙකක් සඳහන් කරන්න.

(b) මානවම්ම රජුගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(04) (i) අනුරාධපුර යුගය අවසාන භාගයේ ශ්‍රී ලංකාවට බලපෑම් එල්ල කළ දකුණු ඉන්දියානු රාජධානි තුන නම් කරන්න. (ලකුණු 03)

(ii) පළමු විජයබාහු රජතුමා ගැන හැදෑරීමේදී වැගත් වන මූලාශ්‍ර දෙකක් සඳහන් කරන්න (ලකුණු 04)

(iii) පළමු විජයබාහු රජුගේ

(a) විදේශ ප්‍රතිපත්තිය

(b) ආගමික කටයුතු කරුණු දෙකක් බැගින් දක්වමින් කෙටියෙන් විස්තර කරන්න (ලකුණු 05)

(05) (i) පහත සඳහන් දෑ ස්පෘශ්‍ය උරුම හා අස්පෘශ්‍ය උරුම ලෙස බෙදා වෙන් කොට දක්වන්න.
(රජමාලිගා, ජනනැටුම්, සිරිත්විරිත්, ඇළවේලි, කෙම් ක්‍රම, බලකොටු) (ලකුණු 03)

(ii) යුනිසේෆ් සංවිධානය විසින් ලෝක උරුමය ලෙස නම්කොට ඇති ශ්‍රී ලංකාවේ ස්ථාන 04ක් නම් කරන්න. (ලකුණු 04)

(iii) පැරණි හින්දු පොත්වල සඳහන් සිරිත් විරිත් කිහිපයක් පහත දැක්වේ. ඒවා කුමන අවස්ථාවකට සම්බන්ධ වේදැයි සඳහන් කරන්න.

(a) ජාතකර්ම (b) නාමකරණ (c) කර්ණවේදන

(d) අන්තප්‍රාශාන (e) විද්‍යාරම්භ (ලකුණු 05)

(06) (i) පහත සඳහන් ස්ථානවල ආරක්ෂිත බලකොටු තනාගෙන රටත් ජනතාවත් ආරක්ෂා කළ නායකයන් පිළිවෙළින් නම් කරන්න.

(a) මිනිපේ රංදෙණිය

(b) යාපහුව

(c) රුහුණේ ගෝවින්ද මලය (ලකුණු 03)

(ii) පොළොන්නරු රාජධානිය බිදවැටීමෙන් පසු තෙත් කලාපයේ පිහිටුවාගත් රාජධානි 4ක් නම් කරන්න. (ලකුණු 04)

(iii) (a) දෙවන පරාක්‍රමබාහු රජු මුහුණ දුන් අභියෝග 3ක් සඳහන් කරන්න.

(b) දෙවන පරාක්‍රමබාහු රජුගෙන් සිදු වූ සේවාවන් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 05)

(07) (i) කෝට්ටේ රාජධානිය කරගත් ප්‍රථම රජතුමා නම් කරන්න (ලකුණු 03)

(ii) කෝට්ටේ යුගයේ බිහි වූ උගත් පඬිවරු දෙදෙනෙක් සහ සාහිත්‍ය කෘති දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) යාපනය රාජධානිය පිළිබඳ වාක්‍ය 5ක් ලියන්න. (ලකුණු 05)

(08) (i) ග්‍රීසියේ පැවති පෞර රාජ්‍යයක් නම් කොට එම රාජ්‍යවල කැපී පෙනෙන ලක්ෂණ 2ක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) (a) ග්‍රීක වීර කාව්‍ය 2ක් නම් කරන්න.

(b) ග්‍රීක දාර්ශනිකයන් දෙදෙනෙක් නම් කරන්න (ලකුණු 04)

(iii) රෝම ශිෂ්ටාචාරයෙන් ලොවට උරුම වූ දායාද පහක් සඳහන් කරන්න (ලකුණු 05)